# තනතුරු - ඇබෑර්තු

## රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය (G.O.B.A)

### ''ලේකම් හා ගණකාධිකාධිකාරී'' තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

මෙම සංගමයේ ප්‍රධාන පරිපාලන නිලධාරි තනතුරවන ''**ලේකම් හා ගණකාධිකාරී**'' තනතුරට ද්විතීයන පදනම යටතේ පහත සඳහන් සුදුසුකම් හා අවශ්‍යතා සපුරා ඇති රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශවයෙන් ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *සුදුසුකම්* :
    - ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ / ශ්‍රී ලංකා පරිපාලන III වන පන්තියේ නිලධාරියෙකු වීම.
    - ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවයේ නිලධාරියෙකු වීම.
    - කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි පන්තියේ නිලධාරියෙකු වීම.
    - කළමනාකරණ සේවා නිලධාරි හෝ සමාන්තර සේවයේ I වන පන්තියේ හෝ ඉන් ඉහළ පන්තියක වසර 05ක පළපුරුද්ද සහිත ව්‍යාපාර කළමනාකරණ / වානිජ්‍ය විද්‍යා උපාධිධාරී හෝ ඊට සමාන සුදුසුකම් සහිත නිලධාරියෙකු වීම.

2. *අවශ්‍යතා*
    - 2.1 කොළඹට සැතපුම් 35ක් තුළ ස්ථිර පදිංචිය
    - 2.2 2024.04.01 දිනට වයස අවු 55 ට වැඩි නොවීම.
    - 2.3 රාජ්‍ය සේවයේ වසර 15 ට නොඅඩු සේවා කාලයක් තිබීම.
    - 2.4 ගිණුම් හා පරිපාලන කටයුතු පිළිතුරු ප්‍රාමාණික දැනුමක් / හැකියාවක් තිබීම.
    - 2.5 පරිගණක සාක්ෂරතාවය හා Internet & Email භාවිතා කිරීමේ හැකියාව
    - 2.6 ඉංග්‍රීසි භාෂාවෙන් හා සිංහල භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව
    - 2.7 දෙමළ භාෂාව දැන සිටීම අතිරේක සුදුසුකමක් සේ සලකනු ඇත.
    - 2.8 අවම වසර 2ක ද්විතීයන පදනම යටතේ නිදහස් කිරීමට සේවා ප්‍රධානී / පත්වීම් බලධාරීගේ කැමැත්ත

3. *වැටුප* :
    - 3.1 අයදුම්කරු රාජ්‍ය සේවයේ නිත්‍ය තනතුර යටතේ ලබන මූලික වැටුප හා අනුමත සියලු දීමනා
    - 3.2 සංගමය විසින් ලබා දෙන මූලික වැටුපෙන් 50% ක් වූ දීමනාව
    - 3.3 රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2020 අනුව විශ්‍රාම වැටුප් හිමිකම ආරක්ෂා කිරීම සඳහා මූලික වැටුපෙන් 25% ක් ප්‍රේෂණය කරනු ඇත.

4. ***රාජ්‍ය සේවයෙන් නිදහස් කිරීම*** : ( අංක 231029 දරන 2022 දෙසැම්බර් 14 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* අනුව) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික (I කාණ්ඩයේ) රීති 166 සමග කියවිය යුතු 178 වන රීතිය අනුව - පරිශිෂ්ට අංක 12 ප්‍රකාර - නිලධාරියාගේ කැමැත්ත ප්‍රකාශිත ආකෘතිය සිය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ එකඟතාවය ද ලබාගෙන ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය. (www.psc.gov.lk වෙබ් අඩවියෙන් ආකෘතිය භාගත කළ හැක.)

**2024.04.07** දින දහවල් **12.00** ට පෙර ලැබෙනසේ ඔබ විසින් සකස් කර ගත් ඉල්ලුම් පත්‍රයක් දෙපාර්තමේන්තු ප්‍රධානී මගින් (ඉහත 4.1 අනුව නිදහස් කල හැකි බවට සහතික කර) පහත සඳහන් ලිපිනයට කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ලේකම් හා ගණකාධිකාරී"** තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**ඩී. එස්. පී. දුනුසිංහ,**
සභාපති,
රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය.

2024 පෙබරවාරි මස 29 වැනි දින,

65/1, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත කොළඹ 02
දුරකථන අංක : 011-2434598 2473633 2473577
ෆැක්ස් : 0112434212 වෙබ් අඩවිය : www.goba.lk

03-152